පසුගිය දිනවල සිදුවූ පාතාලයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු ආයුධ පෙන්වීමට පොලිසිය විසින් කැඳවා ගෙන ගිය බවත්, එහිදී සිදුවූ බවට කියවෙන "යම් සිදුවීමක්" නිසා පොලිසියට බලය යොදාගැනීමට සිදුවූ බවත්, ඒ ඔස්සේ පොලිස් වෙඩිපහරින් ඔවුන් දෙදෙනා මියගොස් ඇති බවත් මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් වී තිබිණි.
මේ අතර ඉරිදා ලංකාදීප පුවත්පතෙන් (05/16) "පොලිසියෙන් වෙඩි කෑ පාතාල කෙරුමෝ" යන සිරස්තලය යටතේ මේ පිළිබඳ ලිපියක් ඉදිරිපත් වේ. මෙම ලිපිය තුළ "...මර්දනය කළ යුතු තැන මර්දනය කළ යුතුමය. නියපොත්තෙන් කඩා දමන්නට තිබූ දෙයක් වුවද පොරොවෙන් හෝ එය කඩා දැමිය යුතුය. මේ වන විට ආරක්ෂක අංශ ගෙන ඇත්තේ එම ක්‍රියාමාර්ගය බව අපි දනිමු" යනුවෙන් සඳහන් වේ.
නීතියේ ආධිපත්‍යය යනු සැබවින්ම ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය මැනීමේ ප්‍රධාන මිනුම් දණ්ඩක් බවට පත්ව තිබේ. න්‍යායානුකූලව ගත් විට නීතියේ ආධිපත්‍යය මත ක්‍රියාත්මක වන රටවල් තුළ සියල්ලෝම නීතියට අනුකූල විය යුතු අතර, නීතිය සියළු දෙනාටම සාධාරණද විය යුතුවේ. යම් කිසි සැකකරුවෙකු අතින් කුමනාකාරයක අපරාධයන් සිදුවූවා යැයි කියැවුණද, නීතිය ඔවුන්ටද අපටද සමාන විය යුතුයි. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, සැකකරුවෙකු අපරාධකරුවෙකු බව නීතියෙන් තහවුරු වන්නේ නම්, එම පුද්ගලයාට නිසි දඬුවම් පැණවිය යුත්තේද නිසි ක්‍රමවේදයන් ඔස්සේම නීතිය මගිනි.
එම පසුතලය සමගින් බලන විට, ඉරිදා ලංකාදීප ලිපියේ මෙම සඳහන පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #SundayLankadeepa